

# ක්‍රීඩාවේ සූදුවට තිත තබමු ?



ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්
ප්‍රවීණ මාධ්‍යවේදී
ඇස්.පියසේන

'මිනිසෙකු පිට නැගි අසරුවෙකි
ඒ බර ගෙයි වහලට බරකි
පාන්දරින් පැරදුන ඒ මිනිහා
හැන්දෑවෙත් අසු පිටට නගී'

ගායන ශිල්පී විශාරද සුනිල් එදිරිසිංහ මේ ගීතය ගයන්නට දශක තුනකට පෙර කොළඹ තුරඟ තරඟ පිටිය එදා පැවැති රජය වසා දැමුවේ අස්ව රේස්වලින් වියරුවී සිටි අහිංසක ජනතාව ඉන් මුදවා ගැනීමේ පියවරක් වශයෙනි. එසේ වුවද රේස් බුකී රහසේ වුවත් ප්‍රසිද්ධියේම පවත්වාගෙන ගිය බව අපි දනිමු.

ඒ කාලයේදී රේස් කොලයක් කියැවීමටවත් අකුරු නොදත් වට්ටි අම්මලා පවා 'කෙටන් හෝල්' අශ්වයාත් 'පිගොට්' අශ්වාරෝහකයාත්

***පසුගියදා කොදෙව් කණ්ඩායම තරඟයෙන් පරාජය වී නම් ජැමෙයිකාවේ කිසිවෙකු දිවි නසාගන්නේ නැත. ඔවුන්ට ආඩම්බරවීමට තවත් ක්‍රීඩා තිබේ.***

(ජොකී) හොඳින් දැන සිටියහ. 'වින්' සහ 'ට්‍රිබල්' යනාදී වශයෙන් ඔට්ටු ඇල්ලීමට ධනවතුන්ගේ රුපියල් 1000 මෙන්ම දුප්පතුන්ගේ රුපියල් 2 කද පූජා වට්ටියට එකතු වූයේ ලක්ෂ ගණනිනි.

මුදලට තරඟය පාවාදීම අශ්වයාට කළ නොහැකි වුවත් ජොකියා එය කරන්නට පටන්ගත් විට බොහෝ දෙනා කලකිරීමට පත්වූහ. අද කුරුඳුවත්තේ අශ්වයන් නොදිව්වත් බුකී ජාවාරම රට තුළ තදින්ම ස්ථාපිත වී ඇත.

පසුගියදා බුකීවල වැඩියෙන්ම ඔට්ටු ඇල්ලුනේ අශ්වයන්ට නොව ක්‍රිකට් ක්‍රීඩකයන්ටය. පසුගිය ඉරිදා බුකී කාරයන්ට ලක්ෂ ගණනින් ආදායම වැඩි වූ බව කියනු ලැබේ. ඊට හේතු කීපයක් සැරිසරයි. 90%ක්ම ඔට්ටු අල්ලා ඇත්තේ ශ්‍රී ලංකාව ජයග්‍රහණය කරන බවටය. 'අතුරු ඔට්ටු'වලින් බොහොමයක්ද පරාජය විය. 'ක්‍රිස් ගේල් පනහක් ගහනවා' සහ 'ලසිත් මාලිංග අඩුගානේ විකට් දෙකක් ගන්නවා' යනුවෙන් ඇල්ලූ ඔට්ටුවල වාසියේ වැඩිබර ගියේ බුකී කාරයන-"ටය. ඇත්ත වශයෙන්ම මේ ක්‍රිකට් තරඟ කාලය තුළ අසන්නට ලැබුණු සංවේගජනක පුවත් වෙන කිසිම රටක අසන්නට ලැබේදැයි අපි නොදනිමු. ක්‍රිකට් ක්‍රීඩාවේ නිර්මාතෘවරු වන ඕස්ට්‍රේලියාවේ සහ එංගලන්තයේ තරඟයක් නිමා වූ විට ජය පරාජය සිනාමුසුව පිළිගන්නා අන්දම අපි දැක ඇත්තෙමු. එහෙත් ශ්‍රී ලංකාවේ ඇත්තේ ක්‍රීඩා උද්යෝගයක් නොව ක්‍රීඩා වියරුවකි. 1996 දී ඕස්ට්‍රේලියාවේ"ී ගුවන් විදුලියේ සාකච්ඡාවකට සහභාගිවෙමින් එහි පදිංචි ශ්‍රීලාංකිකයකු කළ ප්‍රකාශයක් මට සිහිපත්වේ.

ශ්‍රී ලංකාවේ පළමුවෙනි ක්‍රීඩාව ක්‍රිකට්ය. දෙවැනි ක්‍රීඩාව ක්‍රිකට් නැරඹීම හෝ විස්තර ඇසීමය. තුන්වන ක්‍රීඩාව ක්‍රිකට් ගැන කතා කිරීමය. වෙනත් ක්‍රීඩා තිබේද යන්න දන්නේ ස්වල්ප දෙනෙකි.
පසුගිය ඉරිදා ශ්‍රී ලංකාවේ පරාජයෙන් පසු පරාජය ඉවසාගත නොහැකිව සිදුවූ පස්දෙනෙකුගේ පමණ මරණ වාර්තා විය. හංවැල්ල හා හැටන් ප්‍රදේශවල තරුණයන් දෙදෙනෙකු ගෙළ වැළලාගෙන මියගියහ. නාවල ප්‍රදේශයේ ගැබිනි කාන්තාවක් 'අනේ පරාදයි නේද?' කියමින් වේදනාවෙන් කෑගැසූ පසු රෝහලේදී ගැබද විනාශවී මරණයට පත්වූ බව වාර්තාවිය. හෘදායාබාධයෙන් මියගිය දෙදෙනෙකු පිළිබඳවද වාර්තා විය. මේ හැරුණු විට පිහියා ඇණුම්, ගිනි තැබීම් වැනි සිද්ධීන් පිළිබඳ පුවත්ද පැතිරේ.

ඕනෑම ක්‍රීඩාවක් හොඳය. එහෙත් ක්‍රීඩා වියරුව භයානකය.

ක්‍රිකට් ක්‍රීඩාව නිසා මේ රටේ අනෙක් සියළුම ක්‍රීඩා 'හඳ රාහුට අසුවූවාක් මෙන්' ක්‍රම ක්‍රමයෙන් පල්ලම් බැස්ස බව අවිවාදයෙන් පිළිගත යුතුය. ක්‍රිකට් ක්‍රීඩාව ගැන දන්නේ ලෝකයේ රටවල් 200යෙන් රටවල් දුසිමක් පමණි. එයින්ද හතරක්ම ඇත්තේ දකුණු ආසියාවේය. මේ රටේ ක්‍රිකට් ක්‍රීඩකයෙක් ජාත්‍යන්තර තරඟයකදී ශතකයක් ලබාගතහොත් එය මාස ගණනක් උදම් අනන්නට තරම් 'විශිෂ්ඨ හපන්කමක්' සේ සැළකේ. සුසන්තිකා ජයසිංහ රටවල් 150ක් සහභාගි වූ ඔලිම්පික් උළෙලේදී රිදී පදක්කමක් දිනාගැනීම අපේ ක්‍රිකට් ලෝලීන්ට සාමාන්‍ය දෙයකි. 1970 බැංකොක් නුවර පැවැති ආසියානු ක්‍රීඩා උළෙලේදී ශ්‍රී ලංකාවේ බණ්ඩාරවෙලින් පැමිණි 'රෝසා' නමැති තරුණයා මීටර් 5000 සහ 10 000 නව ආසියානු වාර්තා පිහිට වූ අන්දම දැන් කාටත් අමතකය. එහෙත් දශක දෙකකට පෙර ක්‍රිකට් කුසලාන දිනා ගැනීම ගැන අපි තවමත් ගී ගයමු.

විස්සයි විස්ස ක්‍රිකට් සූදුවේදී තරඟ පාවාදීම ගැන මේ දක්වා 'ඇඟිල්ල දික්වූයේ' ක්‍රීඩකයන් කීප දෙනෙකුට පමණි. එහෙත් දැන් ක්‍රිකට් විනිසුරුවරයන්ද :ඔපච්රි* මේ චෝදනාවට ලක්ව සිටිති. චෝදනාවට ලක්වූ විනිසුරුවන් නව දෙනාගෙන් තිදෙනෙකු ශ්‍රී ලාංකිකයන් බව වාර්තාවේ.

දැන් අපේ ක්‍රීඩා අමාත්‍යාංශය කළ යුත්තේ 'සූදුව' බුකී කාරයන්ටම කරගෙන යන්නට ඉඩ හැර අනෙකුත් ක්‍රීඩා ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒමට ප්‍රායෝගික වැඩසටහන් ඇරඹීමය. රටවල් දුසිමක නොව මුළු ලෝකයේම පැතිර ඇති මළල ක්‍රීඩා, හොකී, පාපන්දු, වොලිබෝල්, පිහිනීම වැනි ක්‍රීඩා පාසල් මට්ටමෙන් නඟාලීමට යන වියදම ක්‍රිකට් සඳහා යන වියදමට වඩා අල්පය. දිවයිනේ පාසල්වලින් ක්‍රිකට් ක්‍රීඩා කිරීමට සම්පත් ඇත්තේ 10%ටත් අඩු ප්‍රමාණයකටය. ක්‍රිකට් වියරුව නිසා පාසල් විශාල සංඛ්‍යාවක සිසුන් අනෙකුත් ක්‍රීඩා ගැන උනන්දුවක් නොදක්වන බව රහසක් නොවේ.

පසුගිය ඉරිදා කොදෙව් කණ්ඩායම තරඟයෙන් පරාජය වී නම් ජැමෙයිකාවේ කිසිවෙකු දිවි නසාගන්නේ නැත. ඔවුන්ට ආඩම්බරවීමට තවත් ක්‍රීඩා තිබේ. ජැමෙයිකානු ධාවකයෝ සෑම ඔලිම්පික් ක්‍රීඩාවකදීම පිට පිට වාර්තා තබති. අපට කොයිකටත් ඇත්තේ ක්‍රිකට් පමණකි. තරඟමාලාව ජයගත් විට අපි අවුරුද්දක්ම 'අපි වෙමු ලෝක සූරයෝ' කියමින් ජයගීත ගයන්නෙමු. පරාජය වුවහොත් අසරණවී 'දත නියවන්නෙමු'

මේ වියරුවෙන් අපේ බාල පරම්පරාව මුදාගැනීමට නියම ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් පටන්නොගතහොත් අපට සිදුවන්නේ කිසිම ක්‍රීඩාවක් නැති රටක් බවට පත්වීමටය.


**VCE Chemistry 2013**

Individual and Groups
Early completion of syllabus and Exam preparation
Home Visited

**Priyantha Liyanage 0407664546**

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial Law
- Sale of Business
- Conveyancing
- Powers of Attorney
- Wills & Estate Planning
- Migration Law

**Senanie Kurukularatne** LL.B
**Barrister & Solicitor**
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia